## පාසලට, ළමයින්ට හා ගුරුවරුන්ට බලපාන

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නො සැලකිල්ල පිළිබඳ නීතිය



- නොසැලකිල්ල පිළිබඳ නීතිය යනු කුමක්ද?
- විධිමත් අධ්‍යාපනයට සම්බන්ධ ජන කොටස්වලට ඒ නීතියේ ඇති විශේෂ වැදගත්කම කුමක්ද?

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

1. ළිඳට වැටුණු බාල්දිය ගන්නට බැස්ස වූ දහසය හැවිරිදි ශිෂ්‍යයා දියේ ගිලී මිය යයි.

2. ගුරුවරුන් සමඟ ක්ෂේත්‍ර චාරිකාවට ගිය පාසල් සිසුන් තිදෙනෙක් මහවැලි ගඟේ ගිලී නසිති.

3. පාසල් වත්තේ ගසක අත්තක් කපන්නට ගසට යැවූ ශිෂ්‍යයාට විදුලි සැර වැදී සදාකාලික ආබාධිත වූ වගයි.

4. පාඨශාලාන්තර ක්‍රීඩා තරඟ සඳහා ගුරුවරුන් සමඟ දුම්රියෙන් ගිය ළමුන් තිදෙනෙකු අනතුරට භාජනය වීම

5. පාසල් වත්තේ ගසක් කඩා වැටීමෙන් ශිෂ්‍යයෙක් මාරාන්තික තුවාල ලබයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

6. දඹකාර පාසල් සිසුවා මිතුරාට පැන්සලෙන් ඇනීමෙන් ඇය තුවාල වෙයි.

7. අහුන්ගල්ල සත්ව උද්‍යානය නැරඹීමට ගිය සිසුවා කොටියාට බිලි වේ.

8. උ.පෙළ විභාගයට ප්‍රවේශපත්‍ර නොදුන් නිසා සිත් තැවුලට පත් සිසුවිය ලිඳට පනී.

9. ජංගම දුරකථනය ශිෂ්‍ය නායිකාවට අසු වූ නිසා බාලිකා පාසලක සිසුවියක් වැසිකිලියේ ටයිපටියෙන් ගෙල ලා ගනී.

10. තාත්තා ආදරේ නොමැති නිසා බාලිකා පාසලක සිසුවියක් සිව්වෙනි මහලෙන් බිමට පැන දිවි තොර ගනී.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## මෙම සෑම සිද්ධියක්ම ලංකාවේ ෂාසල්වලට සම්බන්ධ සිද්ධීන්ය.මෙම සිද්ධීන්වල පොදු ලක්ෂණ කිහිපයකි.

1. සෑම සිද්ධියක්ම කෙළවර වී ඇත්තේ එක්කෝ ජීවිත හානියකිනි.නැතහොත් බරපතල තුවාල වීම් වැනි ශාරීරික හානියකිනි.

2. එහෙත් මෙම හානි කිසිවෙකු විසින් චේතනාන්විතව කළ ක්‍රියාවන් නිසා සිදු වූ හානි නොවේ.

3. චේතනාන්විතව කළ ක්‍රියාවක් නිසා මෙවැනි ක්‍රියාවක් සිදු කලා නම් නීතිය විසින් අපරාධමය වරදක් (criminal of fence) ලෙස සලකනු ලැබේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

4. එවැනි අපරාධමය වරදක් කරනු ලැබූ තැනැත්තාට එරෙහිව රජය විසින් නඩු පවරනු ලැබේ.

5. චේතනාත්මකව කළ අපරාධමය වරදකට වරදකරු වූ තැනැත්තාට අධිකරණය විසින් එක්කෝ මරණ දඬුවම නැත්නම් සිර දඬුවම එසේත් නැත්නම් දඩයක් පැනවීම වැනි දඬුවමක් නියම කරයි.

6. ඉහත දැක් වූ සිද්ධීන් චේතනාත්මකව කළ ක්‍රියාවන් නිසා සිදු වූ අපරාධ නොවන නමුත් එවැනි ක්‍රියාවන් ද වැරදි ලෙස සලකන අවස්ථා තිබේ.

7. එසේ වන්නේ සැලකිලිමත් වීම හේතු කරගෙන මෙවැනි ජීවිත හානි වලක්වා ගත හැකිව තිබුන නමුත් එසේ සැලකිලිමත් නොවීම නිසා හෙවත් නොසැලකිල්ල නිසා එවැනි හානි සිදු වූ විටය.

8. මේ නිසා නීතිය නොසැලකිල්ල යන්න ද වරදක් කොට සලකනු ලබයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- නොසැලකිල්ල, නීතිය වරදක් කොට සලකන්නේ කවර අවස්ථාවලද?
- නීතිය වරදක් කොට සලකන්නේ කාගේ නොසැලකිල්ලෙන්ද?

Sri Lanka's Largest Past Paper Bank - iskolee.com

**නොසැලකිල්ල පිළිබඳ නීතිය යටතේ කිසිවෙකුගේ හෝ නොසැලකිල්ල නිසා තමන්ට අලාභයක් හෝ හානියක් සිදු වුවහොත් එයට අධිකරණය මගින් ප්‍රතිකර්මයක් ලබා ගැනීමට නම්.........**

**නොසැලකිල්ල ඔප්පු කිරීමට කරුණු 03ක් සම්පූර්ණ විය යුතුය**

1.වග උත්තරකරු යම් යුතුකමක් පැමිණිලිකරුට ඉටුකිරීමට බැඳී සිටිය යුතුය.(duty of care)"අවධාගී යුතුකම"/සුපරීක්ෂාකාරී වීමේ වගකීම)

2.වග උත්තරකරු විසින් ඔහුගේ නොසැලකිල්ල නිසා ඒ යුතුකම් කඩ කිරීම හෝ පැහැර යාමක් සිදුකර තිබිය යුතුය.

3.වග උත්තරකරු විසින් පැමිණිලිකරුට ඉටු කිරීමට බැඳී සිටින අවධානීය යුතුකම හෙවත් සුපරික්ෂාකාරී වීමේ වගකීම කඩකිරීම හෝ පැහැර හැරීම නිසා පැමිණිලිකරුට හානියක් හෝ අලාභයක් සිදු විය යුතුය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමයා පවුල හා පාසල

# නෛතික හිමිකම් හා වගකීම්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පවුල නම් සංස්ථාව තුළ ළමයින් සම්බන්ධ වගකීම හා හිමි වේ

<u>වගකීම්</u>

- ළමයාගේ නම හා වාසගම නියම කිරීම
- ආගම නියම කිරීම ආදිය සම්බන්ධයෙන් නීතිමය හිමිකමක් ඇත.
- දේපල භාරකාරත්වය හිමිවන්නේ දෙමාපියන්ටය.

<u>වගකීම්</u>

- ළමුන් පරීයේෂණය කිරීම හා රැකවරණය සැපයීම
- වගකීම් ඉටු කරන අය මෙන්ම ඉටු නොකරන අය ද ඇත.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමයා සම්බන්ධයෙන් ගරුවරයාගේ වගකීම

නාම ලේඛනයක නම ඇතුළත් කිරීමෙන් පසු පාසලට භාර ගන්නා ළමයා

1.අධ්‍යාපනයෙන් පරි පෝෂණය කිරීම

2.සුපරික්ෂාකාරී වගකීමෙන් බලා ගැනීමේ වගකීම පැවරී ඇත්තේ ගුරුවරයාටය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ළමයින් සම්බන්ධව විදුහල්පති හා ගුරුවරු සතුව ඇති හිමිකම්

1. නියම කරන වේලාව තුළ ළමයින් පාසලට එවිය යුතුය.

2. ළමයා පාසලෙන් බැහැර කළ යුත්තේ ද විදුහල්පති හෝ ගුරුවරයාගේ කිසි අවසරයක් ලබා ගෙනය.

3. ළමයා හැද පැළඳ සිටිය යුත්තේ ද පාසල විසින් නියම කරන ආකාරයටය.

4. ආභරණ පැළඳිය යුත්තේද කොණ්ඩය කැපිය යුත්තේද පාසල කියන ආකාරයටය.

5. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔහු පාසලේ සම්ප්‍රදාය අනුව කටයුතු කළ යුතුය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## ළමුන් සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරී වීමේ වගකීම ගුරුවරයා වෙත පැවරෙන්නේ පාසල් භූමිය තුළ පමණක් නොවේ

1. පාසල පටන් ගැනීමට පෙර
2. පාසල පටන් ගත් පසු
3. පාසල අවසන් වූ පසු/ පාසලෙන් පිටත දී

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- සුපරික්ෂාකාරීවීමේ වගකීම(duty of care)
- ස්ථානීය දෙමාපිය සංකල්පය (in loco parentis)
- ප්‍රති පුරුෂ වගකීම(vicarious liability)

නිබන්ධනය බලන්න

Sri Lanka's Largest Past Paper Bank - iskoles.com

# ළමුයින් පිළිබඳ සුපරීක්ෂාකාරී වීම - අසීමිත වගකීමක් නොවේ

සුපරීක්ෂාකාරීවීමේ වගකීම කඩකිරීම මත නොසැලකිල්ල නීතිය යටතේ විදුහල්පතිවරයෙකු හෝ ගුරුවරයෙකු හෝ දිලික්ත නඩුවක වරදකරුවෙකු විය හැක්කේ -

1. අනතුරට පත් වූ ළමයා පිළිබඳ සුපරීක්ෂාකාරීවීමේ වගකීමෙන් යුතුව කටයුතු කිරීම තම රාජකාරියේ කොටසක් විය යුතුය.

2. ඒ වගකීම ඉටු නොකිරීම හෝ පැහැර හැරීම වැනි නොසැලකිලිමත්වීමක් විදුහල්පති හෝ අදාළ ගුරුවරයා අතින් සිදු විය යුතුය.

3. එසේ නොසැලකිලිමත් වීම නිසා වළක්වා ගැනීමට හැකිව තිබූ අනතුරක් සිදුවීමෙන් ළමයාට හානියක් සිදු විය යුතුය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ගුරුවරුන් නොසැලකිල්ලනිසා සිදුවන ක්‍රියාවන් සඳහා වන්දි හෝ අලාභ ගෙවීම

- රජයේ පාසලක නම් විදුහල්පති හා ගුරුවරුන් සිය රාජකාරී කරන්නේ රජය වෙනුවෙනි.මේ නිසා ප්‍රති පුරුෂ වගකීම යටතේ රජයේ පාසලක විදුහල්පති හෝ ගුරුවරුන් අතින් නොසැලකිල්ල මත සිදු වූ හානියකින් පීඩාවට පත් පාර්ශවයට වන්දිය හෝ අලාභය ගෙවන්නේ රජයයි.
- මේ නිසා එවැනි තත්ත්වයක දී රජයද පාර්ශව කරුවෙකු කළ යුතුය.

**නමුත්,**

- පාසල ළමයින් ගුරුවරුන්ගේ පෞද්ගලික කරුණුවලට සහභාගිකරවීම හෝ

පාසල් විෂය පථයෙන් බාහිරව ගුරුවරුන් විසින් පාසල් ළමුන් පෞද්ගලික කටයුතුවලට සහභාගිකරවා ගැනීමේ දී සිදුවන හානිවලට ගුරුවරයා පෞද්ගලිකවම වගකිව යුතුය.